# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2016

NASTEC

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
අංක. 31/9, 31/10, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08
දුරකථනය: 011-2680711/2680712
ෆැක්ස්: 011 - 2680713
විද්‍යුත් තැපැල: nastecsl@yahoo.com
වෙබ් අඩවිය: www.nastec.lk

# වාර්ෂිකවාර්තාව 2016

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලයේ ප්‍රකාශනයකි.

*(NASTEC)*

*සම්පාදනය: නිශාන්ති මහරගේ මෙනෙවිය*
*සංස්කරණය: ආචාර්ය මුදිත ලියනගෙදර*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
*31/9, 31/10, ඩඩ්ලි සේනානායක මාවත*
*කොළඹ 08*

# පටුන

## Contents


පටුන .......... 2

අප ගැන තතු .......... 3

අපගේ දැක්ම .......... 4

අපගේ මෙහෙවර .......... 4

සභාපතිවරයාගේ සමාලෝචනය .......... 5

කොමිෂන් සභාවේ සාමාජිකයන් .......... 7

සංවිධානයෙහි පැතිකඩ .......... 13

සංවිධාන ව්‍යුහය .......... 14

විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය .......... 15

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවෙහි වෙනත් ක්‍රියාකාරකම් .......... 18

ජාත්‍යන්තර සබඳතා .......... 21

උපදේශක සංසද ක්‍රියාකාරකම් .......... 22

අපගේ කාර්ය මණ්ඩලය .......... 25

කාර්ය මණ්ඩල පුවත් .......... 26

කාර්ය මණ්ඩලය සහභාගි වූ අවස්ථා .......... 26

තුති පිදුම .......... 27

විගණකාධිපති වාර්තාව .......... 29

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (නස්ටෙක්) 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් ස්ථාපිත කළ ආයතනයක් වන අතර 1998 අගෝස්තු මාසයේදී ක්‍රියාත්මකවීම ඇරඹිණ. එය 1998 දෙසැම්බර් 06 වැනි දින නිල වශයෙන් ආරම්භ කරන ලද අතර 1999 ජනවාරි මස සිට පූර්ණ ක්‍රියාකාරී කොමිෂන් සභාවක් බවට පත් විය.

ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්‍ෂණ කරුණු සම්බන්ධව උපදෙස් ලබාදීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වූ ඉහළම ආයතනය වශයෙන් නස්ටෙක් ආයතනය නම් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කෙරෙන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.

## අපගේ දැක්ම

"ශ්‍රී ලාංකීය ජනතාවගේ සමෘද්ධිය හා සෞභාග්‍යය ඉහළ නැංවීම උදෙසා විද්‍යාවේ හා තාක්ෂණයේ විභවය හා භාවිතය පිළිබඳව රජයට උපදෙස් සපයන විශිෂ්ට ආයතනයක් වීම"

## අපගේ මෙහෙවර

"තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීම උදෙසා උසස් විද්‍යා හා තාක්ෂණ ජාතික හැකියාවන් ගොඩනැංවීම සඳහා රජයට ප්‍රතිපත්ති, උපාය මාර්ග හා සැලසුම් ඉදිරිපත් කිරීම"

# සභාපතිවරයාගේ සමාලෝචනය



ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (නස්ටෙක්) සභාපතිවරයා වශයෙන්, 2016 වර්ෂය තුළදී ඉටු කරන ලද ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන මෙම සමාලෝචනය මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

2016 වසර තුළදී,ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව සකස් කර අවසන් කර එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීමට නස්ටෙක් ආයතනයට හැකි විය.එය 2016 දී ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ලෙස අමාත්‍ය මණ්ඩලය විසින්ද අනුමත කරන ලදී. අප්‍රමාද ජාතික වැදගත් කමකින් යුතු, කේන්ද්‍රගත විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර දහයක් මෙම ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව හඳුනා ගනී.ආර්ථික සංවර්ධනය සහ ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම සඳහා වහාම අවශ්‍ය වන ක්ෂේත්‍රවලට අදාලව පර්යේෂණ සිදු කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනය පිණිස මෙම ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව රජයට උපකාරී වෙයි.

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් තමනට පැවරී ඇති බලතල අනුව නස්ටෙක් ආයතනය වාර්ෂික ජාතික විද්‍යා හා තාක්ෂණ වාර්තාව පිළියෙල කිරීම සඳහා 2016 වසර තුළදී ජාතික විද්‍යා හා තාක්ෂණ ආයතන 31 තොරතුරු රැස් කළේය. ඇතැම් විද්‍යා තාක්ෂණ ආයතන , මහා භාණ්ඩාගාරය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ඔවුනට ලබා දෙන මුළු අරමුදල් ප්‍රමාණය වැය නොකරන බව රැස් කරගත් තොරතුරු වලින් පැහැදිලි විය. තවද, අලෙවි කළ හැකි නිපැයුම් හා තාක්ෂණයන් වැඩි දියුණු කර ඇත්තේ සුළු ප්‍රමාණයක් පමණි. ජාතික විද්‍යා හා තාක්ෂණ ආයතන විසින් ලබා ගෙන ඇති පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවද ඉතා පහළ මට්ටමක පවතී. එසේ වුවත්, ජාතික විද්‍යා හා තාක්ෂණ ආයතන වල විද්‍යාඥයන් විසින් පර්යේෂණ ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් උපදවනු ලැබේ. කෙසේවෙතත් ඒවායෙන් බහුතරය පර්යේෂණ සමුළු වලදී කරන ලද ඉදිරිපත් කිරීම් වල සාරාංශ වේ.ඉහළ බලපෑමක් ඇති පර්යේෂණ සගරා වල පළ කළ හැකි වඩාත් ඉහළ ගුණාත්මකබවකින් යුතු පර්යේෂණ මෙම ආයතන වලින් වැඩියෙන් සිදු කිරීමද අවශ්‍යවේ.

ජාතික විද්‍යා හා තාක්ෂණ ආයතන වල පර්යේෂණ , අලෙවි කළ හැකි නිපැයුම් සහ රටේ ආර්ථික සංවර්ධනය සහ අපගේ ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම වෙනුවෙන් වහාම අවශ්‍ය කරන තාක්ෂණයන් වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩියෙන් කේන්ද්‍රගත විය යුතුව ඇත.

1994 විද්‍යා හා තාක්ෂණ පනතට අනුව, පනතේ අරමුණු වලට අදාලව ශ්‍රී ලංකාවේ විද්‍යාව සහ තාක්ෂණය සාකච්ඡා කිරීම පිණිස මණ්ඩපයක් සැපයීම සඳහා නස්ටෙක් ආයතනය වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය පැවැත්විය යුතුය.2016 වසර තුළදී නස්ටෙක් ආයතනය අට වැනි ද්විවාර්ෂිකවිද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය පැවැත්විය.සමුළුවේ ප්‍රධාන අමුත්තා වූයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතාය. මෙම සමුළුව ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් සකස් කිරීම කෙරෙහි කේන්ද්‍රගත විය.මෙමක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයෝ 100 ට වැඩි සංඛ්‍යාවක් සහභාගි වූහ. මෙම ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය 2017 දී විධිමත් කෙරෙනු ඇත.

2016 දී නස්ටක් ආයතනය තවත් වැදගත් ජාතික ප්‍රතිපත්තියක් වන ජාතික ඛණිජ සම්පත් පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීමට මුළ පිරුවේය.ඛණිජ සම්පත් හා සබැඳි ක්ෂේත්‍රවල ප්‍රමුඛ පෙළේ විශේෂඥයෝ මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට සහභාගි වූ අතර එය 2017 දී අවසන් කෙරෙනු ඇත.

1994 විද්‍යා හා තාක්ෂණ පනතට අනුව, නස්ටෙක් ආයතනය පනතේ අරමුණු වලට අදාලව ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීමද අවශ්‍ය වේ. 2016 දී නස්ටෙක් ආයතනය ජාතික විද්‍යා හා තාක්සණ ආයතන දෙකක , එනම් ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ සහ පළතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ කාර්යසාධනය සමාලෝචනය කළේය. මෙම ආයතන සිදු කරන පර්යේෂණ ජාතියේ අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කරන බවට වග බලා ගැනීම පිණිස ඒවායේ ගුණාත්මකබව,

පිරිවැය ඵලදායීබව, අදාලත්වය සහ බලපෑම තක්සේරු කිරීමේ අරමුණින් අදාල ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සැදුම්ලත් සමාලෝචන මණ්ඩල විසින් මෙම සමාලෝචන සිදු කරන ලදී.

2016 දී නස්ටෙක් ආයතනය විසින් සිදු කරන ලද තවත් ප්‍රධාන ක්‍රියාකාරකමක් වූයේ ‘‘ස්වාභාවික හේතු නිසා සිදුවන ආපදා බලපෑම් අවම කිරීම-ප්‍රතිපත්තියේ සිට ව්‍යවහාරයට"යන මැයෙන් ජාත්‍යන්තර වැඩමුළුව මෙහෙයවීමයි.විදේශ රටවල් 18 ශ්‍රී ලංකාවේ නියෝජිතයෝ මෙම වැඩමුළුවට සහභාගි වූ අතර එහි ප්‍රතිඵලය වූයේ තීව්‍ර ස්වාභාවික සිදුවීම් හේතුවෙන් ඇතිවන ආපදා හා උවදුරුවල බලපෑම අවම කිරීම පිළිබඳ කොළඹ යෝජනා සම්මතයයි. නොබැඳි හා අනෙකුත් සංවර්ධනය වන රටවල විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මධ්‍යස්ථානය(NAM S&T Centre) සමඟ ඒකාබද්ධව මෙම වැඩමුළුව සංවිධානය කෙරිණි.

නොබැඳි හා අනෙකුත් සංවර්ධනය වන රටවල විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මධ්‍යස්ථානයෙහි ශ්‍රී ලංකා ජාතික කේන්ද්‍රස්ථානය වන බැවින් එම මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හා විද්‍යා පරිපාලකයන් වෙනුවෙන් පුහුනු අවස්ථා ගණනාවක් ලබා දීමට නස්ටෙක් ආයතනය සම්බන්ධ වී ඇත.2016 වර්ෂය තුළදී විද්‍යා හා තාක්ෂණ ආයතන වල මානව සම්පත් සංවර්ධනය සඳහාද නස්ටෙක් ආයතනය තවත් ක්‍රියාකාරකම් ගණනාවක් මෙහෙයවූයේය .‘‘පර්යේෂණ යෝජනා ලිවීම සහ පර්යේෂණ ලිපි සමාලෝචනය හා සංස්කරණය’’ පිළිබඳ වැඩමුළුව සහ ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් වෙනුවෙන් මූලික සංඛ්‍යානය පිළිබඳ කෙටි පාඨමාලාවක් මේ අතර විය.

නස්ටෙක් ආයතනයෙහි තරුණ විද්‍යාඥ සංසදය විසින් පිට පිට 5 වැනි වරටත් සංවිධානය කරන ලද ජාතික සම්මන්ත්‍රණය තරුණ විද්‍යාඥයන්හට සිය පර්යේෂණ මගින් හෙළිදරව් කරගත් කරුණු ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැපයුවේය. මෙය ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා නස්ටෙක් ආයතනය විසින් සිදු කරන ලද තවත් විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකමකි.

2017 දී ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය සකස් කර අවසන් කිරීම,ජාතික ඛණිජ සම්පත් ප්‍රතිපත්තිය සකස් කර අවසන් කිරීම සහ ආර්ථික සංවර්ධනය සහ ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතනවල කාර්යක්ෂම බව සහ නිමැවුම වැඩි කිරීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රජයට නිර්දේශ ලබා දීම ඇතුළුව වාර්ෂික සැලැස්මේ හඳුනාගෙන ඇති සියළු ක්‍රියාකාරකම් ඉටු කිරීමට නස්ටෙක් ආයතනය සැලසුම් කරයි.

නස්ටෙක් ආතනයෙහි ක්‍රියාකාරකම් වෙනුවෙන් ලබාදුන් නොමසුරු සහයෝගය වෙනුවෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි.එතුමන්ගේ දිරිගැන්වීම සහ සහයෝගය නස්ටෙක් ආයතනයට පසුගිය වර්ෂය තුළ සිය ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා උපකාරී විය. අප වෙත ලබා දුන් සහාය හා සහයෝගය වෙනුවෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ අනෙකුත් නිලධාරීන්ටද මාගේ ස්තුතිය පළ කරමි. 2016 වසරේදී අපගේ කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා නස්ටෙක් ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. සහ කාර්ය මණ්ඩලය ලබාදුන් දායකත්වය අගය කිරීමටද ඒ වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කිරීමටද මම මෙය අවස්ථාව කර ගනිමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.ජේ.එස්. විජයරත්න**

**සභාපති**

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

# කොමිෂන් සභාවේ සාමාජිකයන්

## 2016 අප්‍රේල් මස 20 වැනි දින දක්වා



**මහාචාර්ය ඩී.ඒ. තන්ත්‍රීගොඩ**

**සභාපති**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ සභාපති හා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ තාක්ෂණික උපදේශක, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා උපායමාර්ග ඒකකයේ ප්‍රමුඛ උපදේශක, එඩින්බර්ග් විශ්ව විද්‍යාලයේ ආරාධිත පර්යේෂණ සම්මාන සාමාජික



**මහාචාර්ය ආර්.ටී. කුමාරතුංග**

රුහුණු විශ්ව විද්‍යාලයේ ධීවර ජෛව විද්‍යා අංශයේ ප්‍රධානි සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය .

**දරන ලද වෙනත් තනතුරු**

රුහුණු විශ්ව විද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ ආරම්භක පීඨාධිපති; රුහුණු විශ්ව විද්‍යාලයේ ජෛවවිද්‍යා අංශයේ ප්‍රධානි, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ මහා සභාපතිනි ; ජාතික ධීවර සහ නාවුක ඉංජිනේරු විද්‍යා ආයතනයෙහි සහ ජාතික විද්‍යා පදනමෙහි කළමනාකරණ මණ්ඩල සාමාජිකා.



**මහාචාර්ය ඒ.ඒ.පී.එස්. මනම්පේරි**

කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි අණුක වෛද්‍ය ඒකකයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී සහ ඩර්ඩන්ස් රෝහලේ අණුක ජීව විද්‍යාඥ, ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයේ උපදේශක තාක්ෂණික තක්සේරුකරු



**ආචාර්ය එස්.එස්.නමසිවායම්**

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**දරන ලද වෙනත් තනතුරු**

ඉන්දීය වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ ආයතනයේ එඩියුකේෂන් ලංකාහි පීඨාධිපති; අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, නවීන තාක්ෂණ පිළිබඳ ආතර්සී. ක්ලාක් ආයතනය; කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යුත් තාක්ෂණ ඒකකයේ ප්‍රධානී,



**මහාචාර්ය නාරද වර්ණසූරිය**

ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

**දරන ලද වෙනත් තනතුරු**

ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේඋපකුලපති; ශ්‍රීජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, ළමා රෝග අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය; ශ්‍රී ලංකා උප කුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂ වරුන්ගේ කමිටුවේ සභාපති; රෝයල් ග්වෙන්ට් රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය.



**ආචාර්ය ජේ.වත්තවිදානගේ**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සත්වවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**දරන ලද වෙනත් තනතුරු**

කම්කරු සබඳතා හා විදේශ රැකියා අමාත්‍යාංශයේ රෙදිපිළි නිෂ්පාදන වෙළඳ අංශයේ වැටුප් පාලක මණ්ඩලයේ සාමාජික; ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ ප්‍රධාන ලේකම්; ජාතික ධීවර හා නාවුක ඉංජිනේරු විද්‍යා ආයතනයේ පාලක සභාවේ සාමාජික



**ආචාර්ය ඒ. එම්. මුබාරක්**

හිටපු අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී,කාර්මික තාක්ෂණ ආයතනය

**දරන ලද වෙනත් තනතුරු**

සාර්ක් ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩල සාමාජික, ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාවේ විද්‍යා හා තාක්ෂණ උප කොමිෂන් සභා සම්බන්ධීකරණ නිලධාරී,අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂඥ උපදේශක කමිටුවේ සාමාජික

## 2016 ජූනි 30 වැනි දින සිට



**මහාචාර්ය එම්.ජේ.එස්. විජයරත්න–සභාපති**

කැළණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ සත්ව විද්‍යාව පිළිබඳ සභාපති

**දරන ලද වෙනත් තනතුරු**

කැළණිය විශ්ව විද්‍යාලයේ උප කුලපති; කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයෙහි පීඨාධිපති,
ශ්‍රී ලංකවේ උප කුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ සභාපති ; පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි කළමනාකරණ මණ්ඩල සභාපති.ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි, නවීන තාක්ෂණ පිළිබඳ ආතර්සී. ක්ලාක් ආයතනයෙහි,ජාතික ධීවර සහ නාවුක ඉංජිනේරු විද්‍යා ආයතනයෙහි,ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනයෙහි, ජාතික විද්‍යා පදනමෙහි, ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි,කාර්මික තාක්ෂණ ආයතනයෙහි සහ වයඹ පළාතේ පළාත් පාරිසරික අධිකාරියෙහි පාලක සභා සාමාජික.



**මහාචාර්ය ආර්.ටී. කුමාරතුංග**

රුහුනු විශ්ව විද්‍යාලයේ ධීවර ජෛවවිද්‍යා අංශයේ ප්‍රධානි සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය .

**දරන ලද වෙනත් තනතුරු**

රුහුනු විශ්ව විද්‍යාලයේධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ ආරම්භක පීඨාධිපති;රුහුනු විශ්ව විද්‍යාලයේ ජෛවවිද්‍යා අංශයේ ප්‍රධානි, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ මහා සභාපතිනි; ජාතික ධීවර සහ නාවුක ඉංජිනේරු විද්‍යාආයතනයෙහි සහ ජාතික විද්‍යා පදනමෙහි කළමනාකරණ මණ්ඩල සාමාජිකා.



**මහාචාර්ය ඩබ්ලිව් එල් සුමතිපාල**

ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක, පරිසර අමාත්‍යාංශය සහ වෙලි ආරක්ෂා ව්‍යාපෘතියෙහි උපදේශක,මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය

**දරන ලද වෙනත් තනතුරු**

සභාපති, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකාව; භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය;දේශගුණික විපර්යාස අංශයේ ආරම්භක අධ්‍යක්ෂ හා දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රධාන මැදිහත්කරු, පරිසර හා ජාතික සම්පත් අමාත්‍යාංශය; දේශගුණික විපර්යාස පිළිබඳ එ.ජා.රාමු ප්‍රඥප්තියේ අනුවර්තන අරමුදල් මණ්ඩල සාමාජික; පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීම පිළිබඳ විශේෂඥ කමිටු සභාපති; පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම පිළිබඳ විශේෂඥ කමිටු සාමාජික; දේශගුණික විපර්යාස පිළිබඳ එ.ජා.රාමු ප්‍රඥප්තියට පාර්ශ්ව කරුවන්ගේ සමුළුවට ශ්‍රී ලංකා නියෝජිත මන්ඩලයේ ප්‍රධාන මැදිහත් කරු හා ජ්‍යෙෂ්ඨ සාමාජික; ජාතික ඕසෝන් ඒකකයේ අධ්‍යක්ෂ හා පරිසර අමාත්‍යාංශයේ මොන්ට්‍රියල් මූලලේඛ ඒකකයේ ජාතික සම්බන්ධීකාරක , මොන්ට්‍රියල් මූල ලේඛ පාර්ශ්ව කරුවන්ගේ හා කලාපීය **ODS** නිලධාරින්ගේ ක්‍රියාකාරී කණ්ඩායම් විවෘතාන්ත රැස්වීමට ශ්‍රී ලංකා නියෝජිත මන්ඩලයේ ප්‍රධානී, මොන්ට්‍රියල් මූල ලේඛය ක්‍රියාත්මක කිරීමේ කමිටු සභාපති, මොන්ට්‍රියල් මූලලේඛ බහු පාර්ශ්වික අරමුදලේ විධායක කමිටු සාමාජික



**මහාචාර්ය ඩී.එන්. කරුණාරත්න**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රසායන විද්‍යා අංශය ,පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**දරන ලද වෙනත් තනතුරු**

බාහිර කථිකාචාර්ය,ගුඑල්ෆ් විශ්ව විද්‍යාලය, කැනඩාව; ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර මහාචාර්ය;කැනඩාවේ වෝටර්ලූ විශ්ව විද්‍යාලයේ බාහිර විද්‍යාඥ; ඇ.එ.ජ., කැන්සාස් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සම්මාන සාමාජික; තායිලන්තයේ මහිදෝල් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ ආශ්‍රිත සහකාර හා බාහිර විද්‍යාර්ථී.



**මහාචාර්ය ගුණපාල නානායක්කාර**

අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සහ ජාතික වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසම

**දරන ලද වෙනත් තනතුරු**

ජාතික අධ්‍යාපන ආයතන අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන අමාත්‍යාංශය; ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාල; සභාපති,ශ්‍රී ලංකා සමූපකාර කළමනාකරණ ආයතනය ; මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා යටතේ වන සසෙක්ස් කොලෙජ් ජාලයෙහි ප්‍ර.වි.නි.; ශ්‍රී ලංකා පරිපාලන ප්‍රතිසංස්කරණ සහා සාමාජික;දකුණු ආසියාවේ කළමනාකරණ සංවර්ධන ආයතන සංගමයේ (AMDISA) උප සභාපති; ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ජාතික තාක්ෂණ අධ්‍යාපන ආයතනය හා ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය යන ආයතන වල පාලක සභා සාමාජික



**මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ බෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා සභාපති; ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභා සාමාජික



**මහාචාර්ය අර්ජුන පී.ද සිල්වා**

ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනයෙහි (SLADA) සභාපති; කැළණිය විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය අංශ ප්‍රධානි;උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය; ආමාශ හා අන්ත්‍ර පිළිබඳ වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩල සභාපති; ක්‍රීඩා වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩල සාමාජික;ජාතික අධ්‍යාපන ආයතනයේ වෛද්‍ය අධ්‍යයන සභා සාමාජික; ආමාශ හා අන්ත්‍ර පිළිබඳ වෛද්‍ය විද්‍යා පුහුණුකරු; ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා කවුන්සිල සාමාජික World Journal of Gastroenterology සම සංස්කාරක

- සභාපතිතුමා කොමිෂන් සභාවේ ප්‍රධානත්වය දරයි.
- අධ්‍යක්ෂතුමා ප්‍රධාන විධායක නිලධාරීවරයාය.
- ප්‍රතිපත්ති, සැලසුම් වාර්තා සහ අනෙකුත් විද්‍යා හා තාක්‍ෂණ සම්බන්ධ ලේඛණ සකසන අධ්‍යයන කණ්ඩායම් හා උපදේශක සංසද සඳහා පහසුකම් සැලසීම සහ කළමනාකරණය කිරීම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් විසින් සිදුකෙරේ.
- විධායක ලේකම්තුමා කොමිෂන් සභාවේ ලේකම් වන අතර කාර්යාල කළමනාකරු වශයෙන්ද කටයුතු කරයි.
- මූල්‍යය හා පරිපාලනය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ සියලුම මූල්‍ය කාරණාවන් කළමනාකරණය කරයි.
- කොමිෂන්සභාවේ අවශ්‍යතාව මත විශේෂිත කාර්යයන් හා පැවරුම් සඳහා උපදේශකවරුන් සහ පර්යේෂණ සහකාරවරුන් බඳවාගනු ලැබේ.

# සංවිධාන ව්‍යුහය



ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (නස්ටෙක්)
සභාපතිතුමා හා කොමිෂන් සභා සාමාජිකයන්
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල්හාපරිපාලන
විධායක ලේකම්
තොරතුරු සන්නිවේදන තාක්ෂණ/දත්තගබඩාසහකාර
වැඩසටහන් සහකාර - මූල්‍ය-
කළමනාකරන සහකාරවරුන්
රියැදුරන්
කාර්යාල සහායකයන්

# විද්‍යා හා තාක්ෂණ සමාලෝචනය

## *රටේ විද්‍යා හා තාක්ෂණ තත්වය පිළිබඳ වාර්ෂික ජාතික සමාලෝචනය*

පෙර වර්ෂයේ ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ ක්‍රියාකාරකම් සමාලෝචනය කරමින් වාර්ෂිකව රජය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමේ වගකීම නස්ටෙක් වෙත පැවරී ඇත. විද්‍යා සහ තාක්ෂණ අංශයේ තීරණ ගැනීම හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වාර්ෂිකව රටක විද්‍යා සහ තාක්ෂණ තත්ත්වය සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

2015 වර්ෂයට අදාල තොරතුරු ලබා ගැනීම පිණිස නස්ටෙක් ආයතනය 2016 දී රටේ විද්‍යා සහ තාක්ෂණ ආයතන 37 ක් යොදාගනිමින් ප්‍රශ්නාවලි සමීක්ෂණයක් පැවැත්වීය. ලද තොරතුරු මත පදනම්ව "2015- ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ තත්ත්වය" යන වාර්තාව පිළියෙල කරන ලදී.

මෙම වාර්තාව පහත සඳහන් ප්‍රධාන සංරචක ආවරණය කරයි:

i) විද්‍යා සහ තාක්ෂණ ආයතන වල මානව හා භෞතික සම්පත්
ii) විද්‍යාව සහ තාක්ෂණය වෙනුවෙන් රජයේ මුදල් වැයකිරීමේ සඵලදායකබව
iii) විද්‍යා සහ තාක්ෂණ ආයතන වල කාර්ය සාධනය
iv) උගතුන්ගේ සංගම්වල විද්‍යා සහ තාක්ෂණ ක්‍රියාකාරකම්

රැස් කර ගන්නා ලද තොරතුරු මත පදනම්ව රටේ විද්‍යා සහ තාක්ෂණ අංශයේ සංවර්ධනය වෙනුවෙන් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කෙරිණි.

# විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය

1994 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත තවත් කටයුතු අතර ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීමද නස්ටෙක් ආයතනය වෙත පවරයි. 2011 සිට 2015 දක්වා නස්ටෙක් විසින් ආයතනික සමාලෝචන දාහතරක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත.එම විස්තර පහත දැක්වේ.

| ආයතනය | අවසන් කළ දිනය |
|---|---|
| ශ්‍රීලංකා ප්‍රතිතන මණ්ඩලය - 1 වැනි සමාලෝචනය | 2011/මැයි |
| ශ්‍රීලංකා ප්‍රතිතන මණ්ඩලය - 2 වැනි සමාලෝචනය | 2015/පෙබරවාරි |
| පරමාණුක බලශක්ති අධිකාරිය - 1 වැනි සමාලෝචනය | 2011/නොවැම්බර් |
| පරමාණුක බලශක්ති අධිකාරිය - 2 වැනි සමාලෝචනය | 2015/අප්‍රේල් |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 2013/ පෙබරවාරි |
| කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 2012/දෙසැම්බර් |

| | |
|---|---|
| මූලික අධ්‍යන ආයතනය | 2013/ඔක්තෝබර් |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | 2014/මාර්තු |
| කාර්මික තාක්ෂණ ආයතනය | 2014/ අප්‍රේල් |
| ජාතික විද්‍යා පදනම | 2014/ අප්‍රේල් |
| ශ්‍රී.ලං.ප්‍ර.ආ. | 2015/ මැයි |
| ජාතික පර්යේෂණ කවුන්සිලය | 2015/ පෙබරවාරි |
| නවීන තාක්ෂණය සඳහා වූ ආතර් සී. ක්ලාක් ආයතනය | 2013/ජූනි |

## ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය පිළිබඳ සමාලෝචනය (FCRDI)

ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී ලබා ඇති ප්‍රගතිය සමාලෝචනය කිරීමටද, හැකි උපරිම මට්ටමින් රජයේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් ඉටු කෙරන බව සහතික කිරීම පිණිස ආයතනය මෙහෙයවනු ලබන විද්‍යාත්මක වැඩසටහන් වල ගුණාත්මක බව, පිරිවැය, සඵලදායක බව, අදාලත්වය හා බලපෑම තක්සේරු කිරීම සඳහා නස්ටෙක් ආයතනය 2016 දී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කාර්ය සාධනය සමාලෝචනය කළේය.

පහත සඳහන් සමාලෝචන මඬුල්ල මෙම සමාලෝචනය සිදු කළහ.

සමාලෝචන මඬුල්ල

1. මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ජේ. එම්. ද කොස්තා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ බෝග විද්‍යා පිළිබඳ සභාපති, කෘෂි විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය (මඬුල්ලේ සභාපති)
2. ආචාර්ය විජය ජයතිලක, සම්මානිත මහාචාර්ය, කෘෂිවිද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය
3. ආචාර්ය එවරාඩ් ජයමාන්න, හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය
4. ආචාර්ය කීර්ති මොහොට්ටි, හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) තේ පර්යේෂණ ආයතනය
5. ආචාර්ය රේණුක ද සිල්වා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය 2016 ජූනි මස 09 වැනි දින සිය ස්වයං තක්සේරු වාර්තාව නස්ටෙක් වෙත ඉදිරිපත් කළේය. සමාලෝචන මඬුල්ලේ පළමුවැනි රැස්වීම, 2016 ජූනි මස 09 වැනි දින නස්ටෙක් ආයතනයේදී පවත්වන ලද අතර මෙම රැස්වීමේදී සමාලෝචන සැලැස්ම තීරණය කර ගැනිණි. මඬුල්ල 2016 ජූලි මස 04, 05, 11 සහ 12 යන දිනවලදී සමාලෝචනය පිණිස ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත ගියහ. කිලිනොච්චි හා අරලගංවිල පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙහි උප මධ්‍යස්ථාන වෙත පිළිවෙලින් අගෝස්තු 15 සහ 16 වැනි දිනවලදී මඬුල්ල ගිය අතර 2016 සැප්තැම්බර් 19 හා 20 යන දිනවලදී අඟුණකොළ පැලැස්ස උප මධ්‍යස්ථානය වෙතද ගියහ.

2016 අගෝස්තු 29 වැනි දින මහඉලුප්පල්ලමදීද 2016 අගෝස්තු 31 වැනි දින හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ හා පුහුණු ආයතනයේදීද මෙම මඬුල්ල ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා පැවැත්විය. 2016 ඔක්තෝබර් 05, 17 සහ 20 යන දිනවලදීද සමාලෝචන මඬුල්ලේ රැස්වීම් පැවැත්විණි. නස්ටෙක් මෙම වාර්තාවේ පළමු කෙටුම්පත බලාපොරොත්තුවෙන් සිටී.

## පළතුරු පර්යේෂණ සංවර්ධන ආයතනය (FRDI) පිළිබඳ සමාලෝචනය


නස්ටෙක් විසින් 2016 වසරේදී සමාලෝචනය කරන ලද දෙවැනි ආයතනය පළතුරු පර්යේෂණ සංවර්ධන ආයතනයයි. ආයතනයෙහි ස්වයං තක්සේරු වාර්තාව ලැබීමෙන් අනතුරුව, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත සමාලෝචන මඬුල්ලක් නස්ටෙක් ආයතනය විසින් පත් කරනු ලැබිණි.

1. මහාචාර්ය එස්. සුබසිංහ, මහාචාර්ය, කෘෂි විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය
2. මහාචාර්ය ලලිත් කරුණානායක, මහාචාර්ය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
3. ආචාර්ය නිමල් දිසානායක, හිටපු අධ්‍යක්ෂ, වී පර්යේෂණ ආයතනය
4. ආචාර්ය වාසනා විජේසූරිය, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, රබර් පර්යේෂණ ආයතනය

සමාලෝචන මඬුල්ලේ පළමු රැස්වීම 2016 ජුලි මස 04 වැනි දින පවත්වන ලදී. 2016 අගෝස්තු මස 18 සහ 19 දින වලදී සමාලෝචනය පිණිස මඬුල්ල පළතුරු පර්යේෂණ සංවර්ධන ආයතනය වෙත ගියේය. 2016 සැප්තැම්බර් 14 වන දින මඬුල්ල පේරාදෙනියේ පිහිටි පළතුරු පර්යේෂණ සංවර්ධන ආයතන උප මධ්‍යස්ථානය වෙතද ගියේය. පාර්ශ්වකරුවන් සමග රැස්වීම 2016 ඔක්තෝබර් 21 වැනි දින පවත්වන ලදී. පළමු වැනි සමාලෝචන වාර්තා කෙටුම්පත 2016 දෙසැම්බර් 22 වැනි දින නස්ටෙක් වෙත ඉදිරිපත් කෙරිණි.

## අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන ලද ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව

2016 මැයි මස 3 වැනි දින ජනාධිපති මන්දිරයේදි පවත්වන ලද විශේෂ රැස්වීමකදි නස්ටෙක් ආයතනය ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් වෙත පිළිගැන්වූයේය.




විද්‍යාත්මක ප්‍රජාවේ ක්ෂණික අවධානය අවශ්‍ය වන හදිසි ගැටළු සහිත අවධානය යොමු විය යුතු ක්ෂේත්‍ර 10 ක් මෙම රාමුව හඳුනාගෙන ඇත. එම හඳුනාගත් ක්ෂේත්‍ර වන්නේ: i) ජලය ii) ආහාර. පෝෂණය හා කෘෂිකර්මය (iii) සෞඛ්‍යය, (iv) නිවාස, (v) පරිසරය, (vi) බල ශක්තිය (vii) ඛනිජ සම්පත්, (viii) රෙදිපිළි සහ ඇඟලුම් (ix) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ දැනුම සේවා සහ (x) මූලික විද්‍යාව, නැගී එන තාක්ෂණයන් හා දේශීය දැනුම යි.

එක් එක් ක්ෂේත්‍රය යටතේ නිශ්චිත ගැටළු හා පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා හඳුනාගනු ලැබ ඇත. මෙම ගැටළු ජය ගැනීම පිණිස මැදිහත් වීම් 600ට අධික සංඛ්‍යාවක් යෝජනා කර ඇති අතර ඒවා ප්‍රධාන කාණ්ඩ 10 ක් යටතේ ලැයිස්තුගත කර ඇත. (i) ප්‍රතිපත්ති සම්පාදනය (ii) ශුද්ධ හා ව්‍යවහාරික පර්යේෂණ (iii) ජෛව තාක්ෂණය (iv) නිනිති තාක්ෂණය (v) නවෝත්පාදන ප්‍රවර්ධනය (vi) දේශීය දැනුම යොදා ගැනීම (vii) තත්ත්ව සහතික කිරීම, ප්‍රතිතනය හා බුද්ධිමය දේපල හිමිකම් (viii) හැකියා වර්ධනය (ix) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනිම හා (x) ප්‍රචලිත කරවීම

විද්‍යා හා තාක්ෂණ ප්‍රජාවට හා අදාල පාර්ශ්වකරුවන්ට මෙම පර්යේෂණ හා අනෙකුත් අදාල ක්‍රියාකාරකම් වෙනුවෙන් ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව මගපෙන්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුවෙහි අවසාන අරමුණ වන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා රටේ ආර්ථික සංවර්ධනය වැඩි කිරිමට දායක වීමයි. එය විද්‍යා හා තාක්ෂණ ආයතනවලට බෙදා හරිනු ලැබ ඇති අතර නස්ටෙක් වෙබ් අඩවියෙන්ද (www.nastec.lk). බා ගත කළහැකිය.




**මහාචාර්ය ධම්මික තන්ත්‍රිගොඩ, නස්ටෙක් ආයතනයෙහි හිටපු සභාපතිවරයා අතිගරු ජනාධිපතිතුමන්ට ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව පිළිගැන්විය.**

# අටවන ශ්‍රී ලංකා ද්වීවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය (BICOST VIII)

විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අටවන ශ්‍රී ලංකා ද්වීවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය පැවැත්වීමේ වගකීම 1994 අංක1 1 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නස්ටෙක් වෙත පැවරී ඇත. මෙම සමුළුව, විද්‍යාව හා තාක්ෂණය හා සම්බන්ධ කරුණු සහ ඒවා රටේ ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම පිණිස යොදා ගන්නාආකාරය පිළිබඳව විද්‍යාඥයන්ගේ, තාක්ෂණවේදින්ගේ, කාර්මික විද්‍යාඥයන්ගේ, පරිපාලකයන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමට නස්ටෙක් හට හැකියාව ලබා දෙයි.

විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ 8 වැනි ද්විවාර්ෂික සම්මන්ත්‍රණය (BICOST-VIII) 2016 නොවැම්බර් මස 24-25 දිනවලදී කටුනායක ගේට් වේ හෝටලයේදී (එයාපෝට් ගාඩ්න්)පැවැත්විණි.

සම්මන්ත්‍රණයෙහි අවධානය කේන්ද්‍රගත වූයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සකස් කිරීම කෙරෙහි ය.

විද්‍යාඥයන්, ඉංජිනේරුවරුන්. පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් හා රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝජිතයන් ඇතුළු ආරාධිත නියෝජිතයෝ 114 ක් මෙම සමුළුවට සහභාගි වූහ.



**විද්‍යාව හා තාක්ෂණය පිලිබඳ 8 වැනි ද්විවාර්ෂික සමුළුවේ විශේෂ අවස්ථා කිහිපයක්**

## ත්‍රීව ස්වාභාවික සිදුවීම් හේතුවෙන් සිදුවන ආපදාවල බලපෑම අවම කිරීම: ප්‍රතිපත්තියේ සිට ව්‍යවහාරයට යන මැයෙන් වූ ජාත්‍යන්තර වැඩමුළුව

නොබැඳි හා අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යාව හා තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානය (NAM S&T Centre) සමග ඒකාබද්ධව නස්ටෙක් ඉහත වැඩමුළුව සංවිධානය කළේය. මෙම වැඩමුළුව 2016 මාර්තු 10 වැනි දින සිට 13 වැනි දින දක්වා කොළඹ 06 සෆායා හෝටලයේදී (බ්ලූ සෆයා) පවත්වන ලදී.

රටවල් 18කින් (කාම්බෝජය, ඊජිප්තුව, හන්ගේරියාව, ඉන්දියාව, ඉන්දුනිසියාව, ඉරානය, මලයාසියාව, මුරුසිය, මියන්මාරය, නේපාලය, නයිජීරියාව, පාකිස්තානය, පලස්තීනය, තායිලන්තය, උගන්ඩාව, වෙනිසියුලාව, සැම්බියාව සහ සිම්බාබ්වේ) පැමිණි විදේශීය සහභාගි වන්නෝ 24 ක් හා දේශීය සහභාගිවන්නෝ 35 ක් වූහ.

වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ, ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන උවදුරුවල බලපෑම අවම කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම් සකස් කිරීම සඳහා නොබැඳි හා වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල පාර්ශ්වකරුවන් අදාල විශේෂඥයන් සමග එකට එක් කිරීමයි.

වැඩමුළුවේ ප්‍රධාන නිමැවුම වූයේ එහිදී සකස් කරන ලද තීව්‍ර ස්වාභාවික සිදුවීමේ හේතුවෙන් ඇතිවන උවදුරුවල බලපෑම අවම කිරීම සඳහා වන ප්‍රායෝගික මාර්ගෝපදේශ පිළිබඳ කොළඹ යෝජනා සම්මතයයි.



වැඩමුළුවේ වැදගත් අවස්ථා කිහිපයක්

## නොබැඳි හා අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් මධ්‍යස්ථානය (NAM S&T Centre)

නොබැඳි හා අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් මධ්‍යස්ථානය, නොබැඳි ව්‍යාපාරයට අයත් රටවල රාජ්‍ය නායකයන්ගේ විවිධ සමුළුවලදී ගන්නා ලද තීරණ වලට අනුව අන්තර් ආණ්ඩු සංවිධානයක් ලෙස 1989 දී පිහිටුවනු ලැබිණි. විද්‍යා හා තාක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන සිය රජයේ දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශය හා නියෝජිත ආයතන මගින් නියෝජනය වන සංවර්ධනය වෙමින් පවතින රටවල් හතලිස් හතරක් මේ දක්වා මධ්‍යස්ථානයේ සාමාජිකයන් ලෙස බැඳී ඇත. නස්ටෙක් මෙම නොබැඳි හා අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් මධ්‍යස්ථානයේ ජාතික කේන්ද්‍රීය ස්ථානය වේ.

සාමාජික රටවල් විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ හා අනෙකුත් කෙටිකාලීන හා දිගුකාලීන පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම සඳහා NAM S&T මධ්‍යස්ථානය විද්‍යාඥයන්ට හා අනෙකුත් නිලධාරින්ට අවස්ථාව ලබා දෙයි. මධ්‍යස්ථානය සහභාගි වන්නන්ට ගුවන් ගමන් ගාස්තුව ලබාදෙන අතර සත්කාරක රට නවාතැන් පහසුකම් සපයයි.

සංවර්ධනය වෙමින් පවතින රටවල විද්‍යාඥයන් වෙනුවෙන් පර්යේෂණ පුහුණු අධිශිෂ්‍යත්වය පිළිබඳ නිවේදනය 2016 අප්‍රේල් මසදී විද්‍යා හා තාක්ෂණ ආයතන අතර සංසරණය කරන ලදී.

සර්මකලාපීය වෙරළබඩ සාගර පර්යේෂණ සඳහා NAM S&T මධ්‍යස්ථානය හා ZMT බ්‍රිමෙන් ඒකාබද්ධ අධිශිෂ්‍යත්වය පිළිබඳව නිවේදනය 2016 ජුලි මසදී අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන අතර සංසරණය කරන ලදී.

ඛනිජ ද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම හා දියුණු කිරීම පිළිබඳ DST (දකුණු අප්‍රිකා) පුහුණු අධිශිෂ්‍යත්වය සම්බන්ධ නිවේදනය 2016 දෙසැම්බර් මසදී විද්‍යා හා තාක්ෂණ ආයතන අතර සංසරණය කෙරිණි.

2016 වර්ෂය තුළදී ශ්‍රී ලංකා විද්‍යාඥයෝ / නිලධාරීහු, මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද පහත සඳහන් ක්‍රියාකාරකම් වලට සහභාගි වූහ.

1. ආර් 2016 ,ශය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංවිද්‍යා ,ලේකම් ,විජයලච්චි මිය .මැයි වැනි 26 – 23 දින දක්වා ඉරානයේ පැවති තාක්ෂණය වාණිජකරණය කිරීම පිළිබඳව ජාත්‍යන්තර පුහුණු වැඩමුළුවේදී ශ්‍රී ලංකාව නියෝජනය කළාය.
2. නස්ටෙක් අධ්‍යක්ෂ ආචාර්ය මුදිත ලියනගෙදර .නි.වි.ප්‍ර / මහතා 2016 ,අගෝස්තු මස වැනි දින සිට 8 පවතින වැනි දින දක්වා මලයාසියාවේ පැවති සංවර්ධනය වෙමින් 12රටවල් වෙනුවෙන් STI ප්‍රතිපත්තිය සහ කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනේදී ශ්‍රී ලංකාව නියෝජනය කළේය.
3. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි )NERD) ඩබ්ලියු .එස් .එල් .ඒ . කරුණාවර්ධන මහතා 2016 ,දෙසැම්බර් වැනි දින දක්වා ඉන්දියාවේදී පැවති 14 වැනි දින සිට 12 - නැගී එන ආර්ථිකයන්හි විකාශය වෙමින් පවතින බලශක්ති ආකෘතිPost COP 21 ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගි වූයේය.

## තරුණ විද්‍යාඥ සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීම 2016

2016තරුණ විද්‍යාඥ සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීම ,7 වැනි දින කොළඹ 22 ජනවාරි 2016ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයටද පැවැත්විණි.

වාර්ෂික මහා සභා රැස්වීමේදී ඥ සංසදයෙහි මෙහෙයුම් කමිටවසර වෙනුවෙන් තරුණ විද්‍යා 2016ුවේ සාමාජිකයන් ලෙස තැනැත්තන් පත් කර ගැනිණි.

- ලෝහිනී අතීත්තන් මිය ශ්‍රී , පීඨයවෛද්‍ය ,ජෛව රසායන අංශය ,කථිකාචාර්ය ෂ්ඨජ්‍යෙ , ලයජයවර්ධනපුර විශ්ව විද්‍යා
- ආචාර්ය දර්ශනී බන්දුප්‍රියපොල් පර්යේෂණ ,පටක රෝපණ අංශය ,ෂ්ඨ පර්යේෂණ නිලධාරීජ්‍යෙ , ආයතනය
- ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක කෘෂි විද්‍යා ,ස්ථානයකෘෂි කාර්මික ජෛව තාක්ෂණ මධ්‍ය ,ක්ෂඅධ්‍ය , ලයරාදෙනිය විශ්ව විද්‍යාපේ ,පීඨය
- ආචාර්ය අසිත බණ්ඩාරනායක ,ඉංජිනේරු පීඨය ,පරිගණක ඉංජිනේරු අංශය ,ෂ්ඨ කථිකාචාර්යජ්‍යෙ , ලයපේරාදෙනිය විශ්ව විද්‍යා
- ආචාර්ය ඉන්දික හේරත්පාංශු හ ,ඥපාංශු විද්‍යා ,ා ශාඛ පෝෂණ අංශයපොල් පර්යේෂණ ආයතනය ,
- එච් ලංකා ශ්‍රී ,ස්ථානයසන්නිවේදන තාක්ෂණ මධ්‍ය තොරතුරු හා ,අමිල ජයශංඛ හේරත් මහතා .එම් . ලයවයඹ විශ්ව විද්‍යා
- ආචාර්ය එච්පසු අස්වනු තාක්ෂණ ආයතනය ,ෂ්ඨ පර්යේෂණ නිලධාරීජ්‍යෙ ,වම්පා .එච් .ඒ .
- ආචාර්ය චූලන්ත ජයවර්ධන ෂ්ඨජ්‍යෙ ,කථිකාචාර්ය ,ඉංජිනේරු පීඨය ,පාංශු සම්පත් ඉංජිනේරු අංශය , ලයමොරටුව විශ්ව විද්‍යා
- ආචාර්ය ඌෂා හෙට්ටිආරච්චි ශ්‍රී , පීඨයවෛද්‍ය ,ජෛව රසායන අංශය ,ෂ්ඨ කථිකාචාර්යජ්‍යෙ , ලයජයවර්ධනපුර විශ්ව විද්‍යා
- එච් විද්‍යාතාක්ෂණය හා වෛද්‍ය ,කථිකාචාර්ය ,කසුනි අකලංකා මෙනෙවිය .එම් .ව පිළිබඳ දකුණු ආසියානු ආයතනය
- ආචාර්ය මෙත්තික විතානගේ (රිසරික පද්ධති ආකෘතිකරණයරසායනික හා පා) පර්යේෂණ සාමාජික , යන ආයතනයජාතික මූලික අධ්‍ය
- ආචාර්ය ආර්පසු අස්වනු තාක්ෂණ ,ෂ්ඨ පර්යේෂණ නිලධාරීජ්‍යෙ ,විජේවර්ධන .නිලන්ති ඒ .එම් . ආයතනය
- එස්සිංහරවීන්ද්‍ර .ඩී .ටී .වී . මයආයතනය මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ,පර්යේෂණ නිලධාරී ,

## තරුණ විද්‍යාඥ සංසදයෙහි පස්වැනි සමුළුව

තරුණ විද්‍යාඥ සංසදයෙහි පස්වැනි සමුළුව ලංකා ඉංජිනේරු ශ්‍රී 7 වැනි දින කොළඹ 22 ජනවාරි 2016 .දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණි 58 ඥයන්ආයතනයේදී විද්‍යා

විස්තිර්ණ සාරංශ ලබා දෙන ලෙස කරන ලද කැඳවීමට ප්‍රතිචාර වශයෙන් තරුණ විද්‍යාඥයන්ගේ සංසද සාමාජිකයන් දෙනෙකු වෙතින් 36විස්තිර්ණ සාරංශ නස්වෙක් වෙත ලැබිණිඥයන්ගේ තරුණ විද්‍යා . සංසදයට ලබා දෙන ගරු සේවයක් වශයෙන් එක් එක්විස්තිර්ණ සාරංශ ජ්‍යොෂ්ඨ විද්‍යාඥයන් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරනු ලැබිණි ඉදිරිපත් කිරීම සඳහා ,ඔවුන්ගේ නිර්දේශ මත පදනම්ව .විස්තිර්ණසාරංශ .තෝරා ගන්නා ලදී 32 තෝරා ගත් විස්තිර්ණ සාරංශ සමුළු කටයුතු සමග ප්‍රකාශයට පත් කරන ලදී .

පහත සඳහන් තේමා පහ යටතේ වාචික ඉදිරිපත් කිරීම් සිදු කෙරිණි.

- කෘෂි විද්‍යාව
- ආහාර විද්‍යාව හා ක්ෂුද්‍රජීවව ිද්‍යාව
- වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යා
- ආර්ථික හා සමාජ විද්‍යා

සියළු ඉදිරිපත් කිරීම් ආරාධිත ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් විසින් ඇගයීමට ලක් කරන ලද අතර එක් එක් සැසියේ හොඳම ඉදිරිපත් කිරීමට සම්මාන සහතියකක් ප්‍රදානය කෙරිණි .

## “පර්යේෂණ ලිපි සමාලෝචනය සහ සංස්කරණය: අප එය නිවැරදිව කරනවාද?”මැයෙන් වැඩ මුළුව

ඉහත වැඩ මුළුව 2016 අප්‍රේල් 28 වැනි දින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 363 දරන ස්ථානයේ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේදී පැවැත්විණි.

වැඩ මුළුවෙහි අරමුණ වූයේ ශ්‍රී ලාංකික විද්‍යාඥයන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකා වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමයි. පර්යේෂණ පත්‍රිකා සමාලෝචනය,සංස්කරණය හා ලිවීම සිදු කරන පර්යේෂකයන් 45 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

**වැඩමුළුවේ සම්පත් දායකයන් පහත සඳහන් පරිදි විය.**

මහාචාර්ය බුද්ධි මාරඹේ
අධ්‍යක්ෂ, කෘෂිකාර්මික අධ්‍යාපන ඒකකය
කෘෂි විද්‍යා පීඨය , පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ආචාර්ය. ප්‍රදීපා බණ්ඩාරනායක,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, කෘෂි විද්‍යා පීඨය ,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ආචාර්ය. අසිත බණ්ඩාරනායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක ඉංජිනේරු අංශය,
ඉංජිනේරු පීඨය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ආචාර්ය මෙත්තිකා විතානගේ
පර්යේෂණ සාමාජික ,
මූලික අධ්‍යයන ආයතනය

## "ආකර්ෂණීය පර්යේෂණ යෝජනාවක් ලිවීම" පිළිබඳ වැඩමුළුව

2016 සැප්තැම්බර් 30 වැනි දින නස්ටෙක් සහ තරුණ විද්‍යාඥ සංසදය කොළඹ 07, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විද්‍යාඥයන් හා පර්යේෂණ නිලධාරින් වෙනුවෙන් ඉහත වැඩමුළුව මෙහෙයවීය.පර්යේෂණ හා සංවර්ධන ආයතන වලට අනුයුක්තව සිටින තරුණ පර්යේෂණ නිලධාරින් හා විශ්ව විද්‍යාල වෙතින් තරුණ ආචාර්යවරුන් 52 ක් වැඩමුළුවට සහභාගි විය.

**පහත සඳහන් සම්පත් දායකයෝ වැඩමුළුව මෙහෙයවූහ.**

මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්.ද කොස්තා
බෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හා සභාපති
කෘෂි විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ආචාර්ය ලලිත් සූරියගොඩ
ජ්‍යෙෂ්ට කථිකාචාර්ය
බෝග විද්‍යාව අංශය
කෘෂි විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එන්. සලීම්
උද්භිද විද්‍යා අංශය
ව්‍යවහාර විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය සාගරිකා ඒකනායක
ජෛවරසායන අංශය
වෛද්‍ය විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය අසෝකා පතිරත්න (මිය)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
සත්ව විද්‍යා සහ පාරිසරික කළමනාකරණ අංශය
විද්‍යා පීඨය,
කැළණිය විශ්ව විද්‍යාලය

## "පර්යේෂකයන් වෙනුවෙන් මූලික සංඛ්‍යානය: මූලධර්ම හා ව්‍යවහාරයන්" පිළිබඳ කෙටි පාඨමාලාව

*තරුණ විද්‍යාඥ සංසදය සහ නස්ටෙක් විසින් සංවිධානය කරන ලද ඉහත පාඨමාලාව 2016 ජූනි 13වැනි සහ 14 වැනි දින වලදී කුලියාපිටිය ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේදී. පවත්වනු ලැබිණි.* තරුණ විශ්ව විද්‍යාල ආචාර්ය වරුන්, අවසන් වසරේ පර්යේෂණ සිසුන් , පශ්චාත් උපාධි හදාරන්නන් හා පර්යේෂණ හා සංවර්ධන ආයතන වලට අනුයුක්ත තරුණ පර්යේෂණ නිලධාරින් 58 ක් මෙම වැඩමුළුවට සහභාගි විය.

වැඩමුළුවේ සම්පත් දායකයන් පහත සඳහන් පරිදි විය.

මහාචාර්ය ආර්.ඕ. තට්ටිල්
සම්මානිත මහාචාර්ය,
බෝග විද්‍යා අංශය
කෘෂි විද්‍යා පීඨය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ආචාර්ය ආර්. අබේනායක
ප්‍රධානි/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශය,
කෘෂිකර්මාන්ත හා වැවිලි කළමනාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

ආචාර්ය එල්. සූරියගොඩ
බෝග විද්‍යා අංශය
කෘෂි විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

# අපගේ කාර්ය මණ්ඩලය

**සභාපති (2016 අප්‍රේල් 20 වැනි දින දක්වා)**

මහාචාර්ය ධම්මික තන්ත්‍රිගොඩ, (විද්‍යාවේදී විද්‍යාපති, ආචාර්ය උපාධි (ඩර්හැම්), FNASSL, FIP(ශ්‍රී ලංකා), ශ්‍රීජයවර්ධනපුරවිශ්වවිද්‍යාලයේභෞතිකවිද්‍යාවපිළිබඳසභාපතිහාජ්‍යෙෂ්ඨමහාචාර්ය( 2004 සිට මේ දක්වා)

**වර්තමාන සභාපති (2016 ජූනි සිට මේ දක්වා )**

මහාචාර්ය එම්.ජේ.එස්. විජයරත්න විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (මිචිගන්) ආචාර්ය උපාධි(කාළණිය) FNASSL, FIBiol(ශ්‍රී ලංකා), සත්ව විද්‍යාව පිළිබඳ සභාපති හා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

**අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.**

ආචාර්ය මුදිත ලියනගෙදර විද්‍යාවේදී M.Phil (පේරාදෙණිය), ආචාර්ය උපාධි (සෝල් විශ්ව විද්‍යාලය)

**<u>විධායක කාර්ය මණ්ඩලය</u>**

**ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ**

ආශා පිටදෙනිය මිය (විද්‍යාවේදී, පේරාදෙණිය, විද්‍යාපති, පේරාදෙණිය)

ඉන්දික සිරිවර්ධන (විද්‍යාවේදී,කොළඹ, MEcon, කොළඹ)

කමලපානි දෙගම්බඩ මිය (විද්‍යාවේදී , විද්‍යාපති කොළඹ)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් හා පරිපාලන**
කුමාරි පීරිස් මිය, (වාණිජවේදී ජ'පුර)

**පරිපාලන නිලධාරී**

ලක්මිණි උඩුගම මෙනවිය (ශාස්ත්‍රවේදී, සබරගමුව)

**<u>සහායක කාර්ය මණ්ඩලය</u>**

**වැඩසටහන් සහකාර- මුදල්**
තුසිතරත්නායක මහතා (M.A.A.T.)

**තොරතුරු සන්නිවේදන තාක්ෂණ/දත්ත ගබඩා සහායක**
අනුරාධ ඉලංගතිලක මහතා (BIT,කොළඹ)

**කළමනාකරණ සහකාරවරුන්**

නිල්මිණි පෙරේරා මිය (විද්‍යාවේදී ජ'පුර)
සයුමි විජේසිංහ මිය
නිශාන්ති මහරගේ මෙනවිය

**කාර්යාල කාර්ය සහායක**

ඒ. ඩී ධනපාල මහතා
නිශාන්ත පියදාස මහතා, කනිෂ්ක ගිම්හාන් මහතා

**රියැදුරන්**

අනිල් හෙට්ටිආරච්චි මහතා
ප්‍රභාත් ජයශාන්ත මහතා
ප්‍රදීප් එරන්ද මහතා

## කාර්ය මණ්ඩල පුවත්

1. නස්ටෙක් ආයතනයෙන් ඉවත් වූ ජොෂ්ට විද්‍යාඥ ඉන්දික සිරිවර්ධන මහතාට නස්ටෙක් ආයතනය 2016 ජූනි 20 වැනි දින සමු දුන්නේය. එතුමන්ගේ වෘත්තීය අනාගතය වෙනුවෙන් අපි සුබ පතන්නෙමු.

2. 2016 අගෝස්තු 08 වැනි දින නස්ටෙක් ආයතනය පරිපාලන නිලධාරි ලෙස සේවයට එක්වූ ලක්මිණි උඩුගම මෙනවිය සාදරයෙන් පිළි ගත්තේය.

## කාර්ය මණ්ඩලය සහභාගි වූ අවස්ථා

1. ආචාර්ය මුදිත ලියනගෙදර 2016 අගෝස්තු 8-12 වැනි දින තෙක් මලයාසියාවේදී පවත්වනු ලැබූ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙනුවෙන් විද්‍යා , තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනේදී ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

# තුති පිදුම

නස්ටෙක් ආයතනය පහත සඳහන් සමාලෝචන මඬුළු සමාජිකයන්ට ඔවුන්ගේ විශිෂ්ට සේවය වෙනුවෙන් සිය ස්තුතිය පළ කරයි.

**ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන සමාලෝචනය**

1. මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා, බෝග විද්‍යාව පිළිබඳ ජොෂ්ට මහාචාර්ය, කෘෂි විද්‍යා පීඨය , පේරාදෙණිය විශ්ව විද්‍යාලය (මඬුල්ලෙහි සභාපති)
2. ආචාර්ය විජයතිලක, සම්මානිත මහාචාර්ය, කෘෂි විද්‍යා පීඨය , පේරාදෙණිය විශ්ව විද්‍යාලය
3. ආචාර්ය එවරඩ් ජයමාන්න , හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය
4. ආචාර්ය කීර්ති මොහොට්ටි, නියෝජ්‍ය අධ්‍යක්ෂ ( පර්යේෂණ) තේ පර්යේෂණ ආයතනය
5. ආචාර්ය රේණුක සිල්වා, ජොෂ්ටකථිකාචාර්ය, පශුසම්පත්, මත්ස්‍ය සහ පෝෂණ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

**පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතන සමාලෝචන මඬුළු සමාජිකයන්**

1. මහාචාර්ය. එස්. සුබසිංහ , කෘෂි විද්‍යා පීඨය , රුහුණ විශ්ව විද්‍යාලය
2. මහාචාර්ය ලලිත් කරුණානායක, ව්‍යවහාර විද්‍යා පීඨ මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය a
3. ආචාර්ය නිමල් දිසානායක, හිටපු අධ්‍යක්ෂ,වී පර්යේෂණ ආයතනය
4. ආචාර්ය වාසනා විජේසූරි, ජේ්‍යෂ්ට විද්‍යාඥ , රබර් පර්යේෂණ ආයතනය

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

# 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලුම මුදල් අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල්, මුදල් හා සමාන දෑ | 1 | 314,338 | 672,270 |
| වෙළඳ හා වෙනත් අයවිය යුතු දෑ | 2 | 2,400 | 17,500 |
| භාණ්ඩ පරිලේඛන/තොග | 3 | 57,881 | 60,235 |
| පූර්ව ගෙවීම් | 4 | 930,381 | 885,103 |
| කාර්ය මණ්ඩල ණය - කෙටිකාලීන | 5 | 188.652 | 191,661 |
| | | **1,493.652** | **1,826,769** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 6 | 16,025,029 | 3,988,674 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 7 | 1,275,500 | 1,275,500 |
| කාර්ය මණ්ඩල ණය - දිගු කාලීන | 8 | 508,737 | 421,259 |
| | | 17,809,266 | 5,685,433 |
| **මුළු වත්කම්** | | **19,302,918** | **7,512,202** |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | 9 | 1,574,380 | 921,022 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම | 10 | 1,216,243 | 2,894,974 |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | 11 | 2,295,143 | 2,430,916 |
| | | **3,511,386** | **5,325,890** |
| **මුළු වගකීම්** | | **5,085,766** | **6,246,912** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **14,217,152** | **1,265,290** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| සමුච්චිත අරමුදල | | 2,540,639 | 2,831,946 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 16,658,610 | 2,589,250 |
| සංචිත | | (4,982,097) | (4,155,906) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **14,217,152** | **1,265,290** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: ටීඊසී/ඒ/එන්ඒඑස්ටීඊසී/1/16/10
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017 ජුනි 30 දින

සභාපති,
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2017 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1800) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වල ට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල නොවීම් පහත දැක්වේ.

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 1,373,579 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් උදෙසා ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය ගිණුම්වල හෙළිදරව් කළයුතු වුවද පිරිවැය රු. 202,811 ක් වූ වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත 5 (ආ) වගන්තිය | පනතේ විධිවිධාන අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචන වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂය හා 2016 වර්ෂය වෙනුවෙන් එකී වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 හා 2017 අප්‍රේල් 19 දිනැති 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ. | කොමිෂන් සභාවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
---

3.1 මූල්‍ය ප්‍රතිඵල
---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 826,191 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 905,677 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,731,868 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ප්‍රදාන හා පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු. 3,761,808 කින් හා රු. 6,164,100 කින් වැඩි වී තිබුණද, ගිවිසුම්ගත සේවා වියදම රු. 2,811,497 කින් වැඩිවීම හා විද්‍යා හා තාක්ෂණ සේවා වියදම රු. 8,110,733 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2010 වර්ෂවලදී අතිරික්තයන් දක්නට ලැබුණද, 2012, 2014 හා 2016 වර්ෂවලදී ඌනතාවයක් නිරීක්ෂණය විය. එසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 12,119,005 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂය අවසානයේදී රු. 15,946,234 ක් වී තිබුණද, 2016 වර්ෂයේදී රු. 11,736,194 ක් දක්වා අඩුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---

4.1 කාර්යසාධනය
---

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 1 වන කොටසේ 5 වන වගන්තිය ප්‍රකාරව, විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම, ආර්ථික වර්ධනය ශක්තිමත් කරලීම, සෞඛ්‍ය, පෝෂණය හා දිළිඳුකම තුරන් කිරීම, අධ්‍යාපන, පුහුණු කිරීම් හා පර්යේෂණ සම්බන්ධයෙන්

අවශ්‍ය මිනිස් සහ වෙනත් සම්පත් සංවර්ධනයට විද්‍යා හා තාක්ෂණය යොදා ගැනීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල අරමුදල් වෙන් කිරීමට අදාලව ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාව තුළ විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මේලනය අවුරුදු දෙකකට වරක් කැඳවීම හා විද්‍යා හා තාක්ෂණය පිළිබඳ සාකච්ඡා කිරීමට මණ්ඩපයක් සැලසීම හා ඒ පිළිබඳව අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සභාවේ ප්‍රධාන කාර්යයන් වේ.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුලදී විද්‍යා හා තාක්ෂණික ආයතන 06 ක සමාලෝචන කටයුතු සිදු කළ යුතු වුවද වර්ෂය තුලදී ආයතන 03 ක පමණක් සමාලෝචන කටයුතු ආරම්භ කොට ඇති අතර අවසන් සමාලෝචන වාර්තා විගණිත දින වන 2017 මාර්තු 17 දින වන විටත් නිකුත් කොට නොතිබුණි.

(ආ) තරුණ විද්‍යාඥයින්ගේ පරිසංවාදයේ (Young Scientists Fova Symposium) 05 වන අදියර 2016 ජනවාරි 22 දින පවත්වා තිබු අතර, එහිදී ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ වාර්තා සංඛ්‍යාව 35 ක් වුයෙන් එය ඉකුත් වර්ෂයේදී පවත්වන ලද 04 වන අදියරේ වාර්තා 51 ක සමඟ සසඳන කළ සියයට 31 කින් අඩු වී තිබුණි.

(ඇ) නොබැඳි ජාතින්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (The Centre for Science and Technology of non-aligned and others developing countries) වෙත වාර්ෂික දායක ගාස්තුව ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු. 2,936,533 ක මුදලක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී එම මධ්‍යස්ථානය මගින් වැඩමුළු 06 ක් පවත්වා තිබු නමුත් එයින් වැඩමුළු 03 ක් සඳහා පමණක් ශ්‍රී ලාංකික නියෝජිතයන් සහභාගී වී තිබුණි.

## 4.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශයට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා කොන්ත්‍රාත් වටිනාකම පිළිවෙලින් රු. 454,800 ක් හා 1,089,480 ක් වූ සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පෞද්ගලික ආයතන දෙකකින් අදාල සේවා ලබාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (1) (අ) රෙගුලාසිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් සිදුකර තිබුණද, මුදල් රෙගුලාසි 134 (3) අනුව ඔහු විසින් සිදුකරන ලද විගණන පරීක්ෂාවන්ට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී අයිතමයන් 05 ක සියයට 50 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වීම් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝජනය කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ප්‍රසම්පාදන පාලනය | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමකින් තොරව සේවා ලබා ගැනීම. |
| (ආ) අයවැය පාලනය | නිසියාකාරව ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | i. ආවරණය නොකල ප්‍රමාද වී පැමිණීම සඳහා නිවාඩු ගණනය නොකිරීම.<br>ii. විද්‍යාත්මක කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඔබ විසින් එවන ලද 2017 ජුනි 30 දිනැති වීඑ/ඊ/එන්.ඊ.එස්.ටී.ඊ.සී./1/16/10 දරණ ඉහත වාර්තාවට අදාල පැහැදිලි කිරීම් පහත දැක්වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**

**(i) හා (ii).**

ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී i) හා ii) ඡේදවලින් වාර්තාවේ දක්වා ඇති දේපල, පිරියත හා උපකරණ වලට අදාල ධාරණ අගයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07ට අනුව නිවැරදිව හෙළිදරව් කිරීමට උපදෙස් දෙන ලදී.

**2.3. නීතිරීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**

අ) පනතේ අංක 05 (ආ) ඡේදය ප්‍රකාරව 2015 වර්ෂයට අදාළ වාර්තාව සකස් කිරීම සඳහා අදාළ ආයතන වලින් තොරතුරු ලබා ගත යුතු බැවින්, එම ආයතන විසින් තොරතුරු නිසි වේලාවට ලබා නොදුන් නිසා මෙම වාර්තාව සකස් කිරීම ප්‍රමාද විය. කෙසේ වුවද මේ වන විට එම වාර්තාව අවසන් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ගරු විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත.

2016 වර්ෂයට අදාළ වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී

ආ) පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇ⎕ලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් මේ වන විට භාවිතා කරයි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතන 06 ක සමාලෝචන කටයුතු සැලසුම් කලද, පහත හේතූන් මත එම ආයතන 06 න් ආයතන 03 ක පමණක් සමාලෝචන කටයුතු ආරම්භ කරන ලදී.

- **i** කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සමාලෝචනය සඳහා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) එකඟතාවය ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම.
- **ii** සමාලෝචන කටයුතු සිදුකිරීමට පත් කරන කමිටුවල සාමාජිකයන් ඉතාමත් කාර්යබහුල පුද්ගලයන් නිසා කමිටු රැස්වීම් සහ ආයතන නිරීක්ෂණ කටයුතු සඳහා වේලාවන් වෙන් කර ගැනීම ඉතා දුෂ්කර වීම.
- **iii** සමාලෝචන කටයුතු සිදු කරන ආයතන විසින් ලබා දිය යුතු වාර්තා ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචන කටයුතු ප්‍රමාද වීම.

(ආ) අප ආයතනයේ කාර්යභාරය වනුයේ පර්යේෂණ පත්‍රිකා ඉල්ලා සිටිම සහ ආයතනයට ලැබෙන පර්යේෂණ පත්‍රිකා පදනම් කරගෙන තරුණ විද්‍යාඥයින්ගේ පරිසංවාදය (Young Scientists Symposium) පැවැත්වීම වන අතර, පර්යේෂණ පත්‍රිකා ලැබීමේ ප්‍රවණතාවය අඩුවීම කොමිසමේ පාලනයෙන් පරිබාහිර කටයුත්තකි.

(ඇ) 2017 වර්ෂයේදී "නාම්" මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ වැඩමුළු සංඛ්‍යාව 6 ක් නොව 7 කි. ඉන් වැඩමුළු 4ක් සඳහා ශ්‍රී ලාංකික නියෝජිතයින් සහභාගී වූ අතර, ඉතිරි වැඩමුළු 03 සඳහා අයදුම්පත් කැඳවුවද අයදුම්පත් කිසිවක් නොලැබුණි.

**4.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

සනීපාරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවන අවස්ථාවේදී ආයතනයේ නියමයන් හා කොන්දේසි ඉදිරිපත් කරන අතර සේවා සපයන්නන් ගිවිසුම් හා මිල ගණන් ලබා දේ. එම ගිවිසුමේ කොන්දේසි අවශ්‍ය පරිදි සංශෝධනය කර මිල ගණන් ප්‍රතිග්‍රහණය කල විට ලිඛිත ගිවිසුමක් ඇතිවේ.

ආරක්ෂක සේවාව සඳහා නැවත මිල ගණන් කැඳවීමේදී ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

**5.ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන වාර්තා වලට අදාල මෙම විගණන ඡේදය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා දැනුවත් කරන ලදී.

**5.2. අයවැය ලේඛනමය පාලනය**

ආයතනයේ 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව රු. මිලියන 36ක් වූ අතර එයින් රු. මිලියන 25ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් හා රු. මිලියන 11ක් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්කර තිබුණි. 2016 වර්ෂයේ ආයතනයේ සත්‍ය වියදම රු. මිලියන 32කි. එනම් ප්‍රතිශතයක් ලෙස 89% කි. ඉතිරි 11%, එනම් රු. මිලියන 3 ක ප්‍රමාණය ඉතිරිවීමට හේතු පහත දැක්වේ.

I. ආයතනය සැලසුම් කල පරිදි බඳවා ගැනීමට නියමිතව තිබූ විද්‍යාඥ තනතුරු දෙක බඳවා ගැනීමට නොහැකි වීම.

II. විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය සඳහා පත්කරන කමිටුවල සාමාජිකයින් ඉතාමත් කාර්යබහුල විම හේතුවෙන් කමිටු රැස්වීම් සහ ආයතන නිරීක්ෂණ කටයුතු සඳහා වෙලාවක් වෙන්කර ගැනීම ඉතාමත් දුෂ්කර වීම හා සමාලෝචන කටයුතු සිදු කරන ආයතන විසින් ලබා දිය යුතු වාර්තා ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචන කටයුතු ප්‍රමාද වීම.

**6. පද්ධති හා පාලනයන්**

මෙම පාලන ක්ෂේත්‍රයන් තුන සම්බන්ධව විශේෂ අවධානය යොමු කිරීමට උපදෙස් දෙන ලදී.

**මහාචාර්ය එම්.ජේ.එස්. විජයරත්න**
**සභාපති**